වේලාවන් තුනක් ඇත. අපි ඒවායෙහි සලාත් ඉටු කිරීම හෝ අප අතර මිය ගිය ඇත්තන් ඒවායෙහි වළ දෑමිම හෝ අල්ලාහ්ගේ දූතයාණෝ අපට තහනම් කළහ

උක්බත් ඉබ්නු ආමිර් අල්-ජුහනී (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "වේලාවන් තුනක් ඇත. අපි ඒවායෙහි සලාත් ඉටු කිරීම හෝ අප අතර මිය ගිය ඇත්තන්
ඒවායෙහි වළ දෑමිම හෝ අල්ලාහ්ගේ දූතයාණෝ අපට තහනම් කළහ. එනම්, හිරු ඉහළට නැගෙන තුරු, එය මතුවෙමින් උදාවන අවස්ථාව, හිරු මුදුනින් අවරට යන තුරු එය මුදුනෙහි පවතින අවස්ථාව හා හිරු බැස යන තුරු බැස යාමට එය දුර්වල වෙමින් පවතින අවස්ථාවය."
[صحيح] [رواه مسلم]

දහවල් කාලයේ වේලාවන් තුනක අතිරේක සලාත් ඉටු කිරීම හෝ ඒවායෙහි මියගිය ඇත්තන් වළ දැමීම හෝ නො කළ යුතු බව පවසා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ එය තහනම් කළහ. පළමු වේලාව: හිරු මතුවෙමින් උදාවන අවස්ථාව, එනම් හීයක ප්රමාණයක් ඉහළට එස වෙන තෙක් හිරු උදාවමින් පවතින ආරම්භ වේලාවය. සාමාන්යයෙන් පැය කාලක පමණ කාලයක් එය තක්සේරු කළ හැක. දෙවැන්න: අහස මධ්යයේ හිරු මුදුනට පැමිණෙන අවස්ථාව ය. එවිට අහස මධ්යයෙන් එය ඉවත් වන තුරු නැගෙනහිර දිශාවට හෝ බටහිර දිශාවට හෝ කිසිදු හෙවණක් නො පවතිනු ඇත. ළුහර් සලාතය ආරම්භ වන විට, නැගෙනහිර දිශාවෙන් හෙවණැලි මතු වනු ඇත. සාමාන්යයෙන් ඒ සඳහා ගත වන්නේ විනාඩි පහක් පමණ කෙටි කාලයකි. තුන්වැන්න: හිරු බැස යන තුරු බැස යාමට එය නැඹුරුවෙමින් පවතින අවස්ථාවය.

https://sunnah.global/hadeeth/si/show/10604